**ශ්‍රී ලංකා කලා මණ්ඩලය - 2019**
**-----------------------------------**

**1.1 මතය**
**------**

ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය,හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**
-----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි.

මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**
-----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1952 අංක 18 දරන ශ්‍රී ලංකා කලා මණ්ඩල පනත | | | |
| (i) 13 (1) උපවගන්තිය | මණ්ඩලයේ ස්ථිර තනතුරක් වන ලේකම්වරයා පත් කිරීමේ බලධරයා විධායක සභාව වුවද එම තනතුර සඳහා පත්කිරීම උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් සිදුකර තිබුණි. | අදාළ නිවැරදි කිරීම් මේ වන විට සිදු කර ඇත. | ශ්‍රී ලංකා කලා මණ්ඩල පනතෙහි විධිවිධානයන්ට අනුකූලව කටයුතු කළයුතු වීම. |
| (ii) 23 උපවගන්තිය | මණ්ඩලය විසින් සකස් කරන ලද සියලු නීති, රීති අමාත්‍යවරයා විසින් ගැසට් නිවේදනයක් මගින් ප්‍රසිද්ධ කර නොතිබුණි. | මේ පිළිබඳ ගණකාධිකාරී උපදෙස් ලබා ගැනීමෙන් අනතුරුව අවශ්‍ය කටයුතු කිරීමට පියවර ගනු ලැබේ. | ශ්‍රී ලංකා කලා මණ්ඩල පනතෙහි විධිවිධානයන්ට අනුකූලව කටයුතු කළයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ)1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය | 2019 දෙසැම්බර් 31 දිනට පැවති රු.1,199,940 ක ස්ථාවර තැන්පතු 03 ක ආයෝජනය සඳහා උචිත ඇමතිවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | ශ්‍රී ලංකා කලා මණ්ඩල විධායක සභාවේ අනුමැතියට යටත්ව මෙම ස්ථාවර තැන්පතු ගිණුම් ආරම්භ කර ඇති අතර ඉදිරියේදී ස්ථාවර තැන්පතු ගිණුම් ආරම්භ කිරීමේදී අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතු වීම. |
| (ඇ)2003 ජූනි 02 දිනැති හා අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| (i) 4.2.6 ඡේදය | පාලක මණ්ඩලය විසින් මාසික සමාලෝචනයන්ට අමතරව කාර්තුමය, අර්ධ වාර්ෂික හා වාර්ෂික කාර්යසාධන වාර්තා ඇගයිය යුතු අතර කාර්තුමය කාර්යසාධන වාර්තා කාර්තුව අවසන් වීමට දින 30 කට පෙර අදාළ රේඛීය අමාත්‍යාංශයට හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2019 වර්ෂයට අදාළ වාර්තා එපරිදි යවා නොතිබුණි. | මූල්‍ය ප්‍රගතිය කාර්තුමය වශයෙන් රේඛීය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන අතර 2003 ජුනි 02 දිනැති පීඊඩී 12 චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කිරීමට ඉදිරියේදී පියවර ගනු ලැබේ. | චක්‍රලේඛ විධිවිධානයන්ට අනුකූලව කාර්තුමය සහ අර්ධ වාර්ෂික කාර්යසාධන වාර්තා අදාළ ආයතන වෙත ඉදිරිපත් කළ යුතු වීම. |
| (ii) 5.2.1 ඡේදය | පිළියෙල කර තිබූ වාර්ෂික අයවැය ලේඛනය චක්‍රලේඛයේ 5.2.1 ඡේදය ප්‍රකාරව ප්‍රාග්ධන හා පුනරාවර්තන, | ශ්‍රී ලංකා කලා මණ්ඩලය ආදායම් උපයන ආයතනයක් නොවන බැවින් වාර්ෂික අයවැය ලේඛනය සකස් කිරීමේදී විගණන විමසුමෙහි දක්වා ඇති ආකාරයට පුනරාවර්තන හා ප්‍රාග්ධන ආදායම් පුරෝකතනය | චක්‍රලේඛ විධිවිධානයන්ට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ආදායම් හා වියදම් පුරෝකථනයන් ඇතුලත් කර පිළියෙල කර නොතිබුණි. | කිරීමට හැකියාවක් නොමැත. | |
| (iii) 6.5.1 ඡේදය | මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය අවසන් වී මාස 4 කට පසු එනම් 2020 ජුනි 25 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. | කොවිඩ් 19 වසංගතය හේතුවෙන් රට පුරා පනවා තිබූ ඇඳිරිනීතිය තත්වය හමුවේ 2020.03.17 දිනට යෙදී තිබූ රැස්වීම අවලංගු කිරීමට සිදු විය. නැවත කාර්යාල කටයුතු ආරම්භ කිරීමෙන් පසු 2020.06.16 දින අදාළ අනුමැතිය ලබාගෙන අවශ්‍ය තොරතුරු සමග මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. | චක්‍රලේඛ උපදෙස් අනුව මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වීම. |
| (ඇ)2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | 2019 වර්ෂය තුළ අප ආයතනය සඳහා භාණ්ඩ හා සේවා මිලදී ගැනීම් සිදු කිරීමට සැලසුම් නොකල බැවින් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොමැත. වැඩසටහන් පැවැත්වීමේදී අවශ්‍ය සේවා මිලදී ගැනීම් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන මණ්ඩලයේ අනුමැතිය යටතේ අපගේ වැඩසටහන් වැය ශීර්ෂ යටතේ සිදුකර ඇත. | චක්‍රලේඛ විධිවිධානයන්ට අනුකූලව කටයුතු කළ යුතුය. |

**1.6 මුදල් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් ඵලදායීව හා කාර්යක්ෂමව කළමනාකරණය නොකිරීම හේතුවෙන් මණ්ඩලයේ ජංගම ගිණුමේ රු.මිලියන 0.5 ත් රු.මිලියන 5.3 ත් අතර පරාසයක මුදලක් සමාලෝචිත වර්ෂය මුළුල්ලේ නිෂ්කාර්යව රඳවා තබා තිබුණි. | 2019 වසරේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ සරසවි ප්‍රතිභා වැඩසටහන සඳහා අවශ්‍ය මුළු ප්‍රතිපාදන රේඛීය අමාත්‍යාංශය වෙතින් ඉල්ලුම් කළද ලැබී ඇත්තේ එම ප්‍රතිපාදන වලින් කොටසක් පමණි. එම ප්‍රමාණය සරසවි ප්‍රතිභා වැඩසටහන පවත්වා අවසන් කිරීමට ප්‍රමාණවත් නොවන බැවින් හා එවකට සිටි ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ සභාපති ඇතුළු විධායක සභාව ඉල්ලා අස්වීම හේතුවෙන් සැලසුම් කර ක්‍රියාත්මක කරමින් තිබූ වැඩසටහන් අවසන් කිරීමට නොහැකිව වී ඇති අතර ලැබුණු ප්‍රතිපාදන ප්‍රමාණය සැලසුම් කර තිබූ ආකාරයට යෙදවීමට නොහැකිව ඉතිරි වී ඇත. | රේඛීය අමාත්‍යාංශයෙන් හා වෙනත් ප්‍රභවයන්ගෙන් මණ්ඩලයට ලැබෙන මුදල් ඵලදායීව හා කාර්යක්ෂමව කළමනාකරණය කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 1,921,714 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. **3,282,782** ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,361,068 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී වැඩමුළු, වැඩසටහන් වියදම් හා මූල්‍ය අනුග්‍රාහකත්ව දැක්වීම් සඳහා වූ වියදම් රු.1,273,581 කින් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ වැටුප්, වේතන හා සේවක ප්‍රතිලාභ වියදම සියයට 15 කින් වැඩිවීම වැඩමුළු, වැඩසටහන් වියදම් හා මූල්‍ය අනුග්‍රාහකත්ව දැක්වීම් වියදම සියයට 22 කින් වැඩිවීම හේතුවෙන් පූර්ව වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අතිරික්තය අඩුවීමට හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා 2011 වර්ෂයේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා දී තිබුණ ද ප්‍රධාන විධායක නිලධාරී තනතුර සඳහා ස්ථිර පත්කිරීම සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් සිදුකර නොතිබුණි. එසේම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරක් නොවන ගිණුම් ලිපිකරු තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරියෙකු බඳවාගෙන 2019 ජනවාරි සිට දෙසැම්බර් දක්වා රු.360,000 ක දීමනා ගෙවා තිබුණි.මූල්‍ය ප්‍රකාශන සහතික කිරීම, ගිණුම්කටයුතු පවත්වාගෙන යාම හා ගෙවීම් කිරීම,අත්තිකාරම් ලබාදීම, චෙක්පත් අත්සන් කිරීම හා බැංකු සැසඳුම් පිළියෙල කිරීම වැනි කටයුතු අධීක්ෂණය සඳහා ස්ථිර පදනම මත නිලධාරියෙකු පත් කර ගැනීමට 2020 ජූලි වන විටද කටයුතු කර නොතිබුණි. | ප්‍රධාන විධායක නිලධාරී තනතුර සඳහා ස්ථිර පත්කිරීමට අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදු කරනු ලැබේ.<br>කොන්ත්‍රාත් පදනම මත ගිණුම් ලිපිකරු තනතුර සඳහා බඳවාගෙන ඇති නිලධාරියාගේ සේවය විධායක සභාවේ අනුමැතිය මත තවදුරටත් ලබා ගැනීමට කටයුතු කර ඇත. | මණ්ඩලයේ අනුමත බඳවා ගැනීමේ පටිපාටියට අනුව තනතුරු සඳහා බඳවා ගැනීමට කටයුතු කල යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ (4) ඡේදය ප්‍රකාරව, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වුවත් මණ්ඩලය විසින් 2019 ජනවාරි සිට අප්‍රේල් දක්වා වූ මාස 4ක කාලය තුල ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ලද ක්‍රියාකාරකම් 3 සඳහා පමණක් ක්‍රියාකාරකම් සැලසුමක් පිළියෙල කර තිබුණි. | වාර්ෂික කාර්යසාධන වාර්තාවේ පිටපතක් විගණනය වෙත ඉදිරිපත් කිරීමට ප්‍රවර්තන වර්ෂයේ සිට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතුය. |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ වත්කම් රු.මිලියන 7.9 ක් ආදායම් රු.මිලියන 14.4 ක් හා වියදම් රු.මිලියන 12.4 ක් පැවතුණද මණ්ඩලයේ ගණුදෙනු අභ්‍යන්තර විගණනයකට ලක්වී නොතිබුණි. | අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කිරීමට අවශ්‍ය කාර්ය මණ්ඩලය අප ආයතනයේ නොමැති බැවින් රේඛීය අමාත්‍යාංශය හරහා අභ්‍යන්තර විගණනයක් සිදුකර දෙන ලෙස ඉල්ලමින් අමාත්‍යාංශ ලේකම් වෙත මින් පෙර ලිපි ඉදිරිපත් කර ඇත. | මණ්ඩලයේ ගණුදෙනු අභ්‍යන්තර විගණනයට ලක් කළ යුතු වීම. |